## දෙවන තේමාව - දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු

13

## 2.5. කිතුනු පවුල



**විවාහය කැඳවීමකි.**

"දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින් නුඹලා දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී පොළව පුරා පැතිර, එය යටත් කර ගන්න' යි ඔවුන්ට වදාළ සේක. "

(උත්පත්ති 1:28)

- **ඉහතින් දක්වා ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.**
- **දෙවියන් වහන්සේ මිනිසාට පවරන ප්‍රධාන කාර්යයන් මොනවා ද?**

විවාහයේ අති විශිෂ්ට ත්‍යාගය වන්නේ දරුවන් ය. එම නිසා විවාහයේ පරම පවිත්‍ර චේතනාව විය යුත්තේ දරුවන් බිහි කිරීම හා ඔවුන් යහපත් ලෙස ඇති දැඩි කිරීම ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්:**

මනා පිළිගැනීමකින් හා පූර්ණ අවබෝධයකින් යුතු ප්‍රේමයේ දේව රාජ්‍යයක් පවුල තුළ ගොඩනැගීම දෙමාපියන්ගේ පරම යුතුකමකි. තම දරුවන් සමාජය වෙත වගකීමකින් යුතු ව කටයුතු කිරීමටත්, පොදු දේපල ආරක්ෂා කරමින් පරිහරණය කිරීමටත්, අන්‍යයන් සමග සහයෝගයෙන් ජීවත්වීමටත් දෙමාපියන් මග පෙන්විය යුතුයි.

ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දී, සමාජයේ යහපත් පුරවැසියන් බවට පත් කිරීමට වග බලා ගත යුතුයි. නිරතුරු පවුලේ යාච්ඤාවේ යෙදෙමින් ආදර්ශවත් දූහැමි ජීවිතයක් ගත කළ යුතුයි.

**දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම්:**

දූහැමි ජීවිත ගත කිරීමට දරුවන් දෙමව්පියන්ට උදව් විය යුතුයි. ඔවුන්ට කීකරු වෙමින් ගෞරව කළ යුතුයි. එදිනෙදා වැඩ කටයුතුවල දී සහාය විය යුතුයි.

ඔවුන්ගේ දුක් වේදනා අසනීපවල දී පිහිට විය යුතුයි. ඔවුන් වියපත් වූ විට හුදකලා නොකර රැක බලා ගත යුතුයි.

**පවුල එක් ආකාරයකින්**
**ගැඹුරු මනුෂ්‍යත්වයේ විශ්ව විද්‍යාලයකි.**

**එහෙත් පවුල තුළ මිනිස් ජීවිතය හා**
**එයට නියමිත කාර්යය**
**සම්පූර්ණයෙන් එළ දරීමට නම්**
**පවුලේ සියලු ම සාමාජිකයන්ගේ**
**සිත් සතන්හි එකමුතුකම ද**
**අඹු සැමි දෙදෙනාගේ**
**පොදු අදහස් බෙදා ගැනීම ද**
**දරුවන් ඇති දැඩි කිරීම සම්බන්ධයෙන්**
**මව්පියන්ගේ උද්යෝගිමත් සහයෝගය ද**
**අවශ්‍ය වෙයි.**

**(වර්තමාන ලෝකයේ**
**ශුද්ධ වූ සභාව 52)**

සමාජයේ කුඩා ම ඒකකය වන පවුල ඉතා උතුම් වූ කාර්ය භාරයක් ඉටු කරන්නා වූ ඉතා වැදගත් ම සමාජ ඒකකය බවට පත් වන්නේ ය.

පවුල සමාජයේ ඉතා වැදගත් ම ඒකකය බවට පත් වන්නේ කිනම් කාරණා මුල් කරගෙන ද?

- රටේ සංවර්ධනයට දායක වීම.
- මානව වටිනාකම් ලොවට දායාද කිරීම.
- සමාජයට යහපත් පුරුවැසියන් බිහි කිරීම.
- පූර්ණ පුද්ගලයකු බිහි කිරීමට අවශ්‍ය නායකත්වය දීම.
- කිතුනු පවුලකින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරන කිතුනුවන් ශුද්ධ වූ සභාවට දායාද කිරීම.

ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ සහාය ඇති ව ඉහතින් දක්වන ලද කරුණු විග්‍රහ කරන්න. විග්‍රහය තුළින් දැනගත් ප්‍රධාන කරුණු අභ්‍යාස පොතේ ලියා ගන්න.

**විවාහයේ සාර්ථකත්වය නම්
දරුවන් බිහිකිරීම පමණක් නොවේ.
දෙමාපියෝ දරුවන්ගේ පළමු සහ ඉතා වැදගත්
ගුරුවරු වෙති. විශ්වාසය ගැඹුරු කරන්නේත්
සදාචාර හා ක්‍රිස්තියානිකම ඇති කරන්නේත් දෙමාපියෝ ය.
නිවස තුළ අධ්‍යාපනයක් පමණක් නොව
දේව වන්දනාවක් ද සිදු වේ. පවුල එකමුතු වී
යාච්ඤා කිරීමෙනුත් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමෙනුත්
මව සහ පියා තම දරුවන් සමග
ප්‍රසාද ස්නාපනයෙන් ලබාගත් පොදු පූජකවරය ක්‍රියාවේ යොදවති.
නිවස තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ වැඩ සිටීම
අත්දැකිය හැකි ය. "මන්ද යම් තැනක දෙදෙනෙක් හෝ
තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස් ව සිටිත් ද
එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි." යි
ක්‍රිස්තුන් වහන්සේ
වදාළ සේක. (මතෙව් 18:20)**

**(කැ:සැ:ධ: 1658)**

- කුඩා කණ්ඩායම්වලට බෙදෙන්න.
- ඉහත දක්වන ලද කොටස හොඳින් කියවන්න.
- මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1 කිතුනු පවුලකින් සිදු වන විශේෂ කාර්යයන් මොනවා ද?

2. ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ අප පවුල තුළ තබා ගැනීමට පවුලක් ලෙස එකට එක් වී කළ හැකි ක්‍රියාකාරකම් මොනවා ද? සාකච්ඡා කර අභ්‍යාස පොතේ ලියාගන්න.

**"මව්පියන්ට සංග්‍රහ කරන්න."**
**(4 වන පනත)**

ඔබේ මුළු සිතින් ඔබේ පියාට ගෞරව කරන්න. ඔබේ මව විඳි ප්‍රසව වේදනාව කිසි දිනෙක අමතක නොකරන්න. ඔවුන් ඔබට මෙලෝ එළිය දුන් බව අමතක නොකරන්න. ඔබ උදෙසා ඔවුන් කළ දේට ඔබ කෙළෙසින් කළ ගුණ සලකන්නට ද?

(උපදේශකයා හෙවත් සිරාක් 7:2728)

- ඔබ වෙනුවෙන් ඔබේ දෙමාපියන් කරන්නාවූ කැපවීම් මොනවා ද? ඒ පිළිබඳ ව සිතා බලන්න.
- ඔබගෙන් ඔබ දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් මොනවා ද?
- ස්වයං ඇගයීමක යෙදෙන්න.
  - ඔබගේ යුතුකම් ලැයිස්තුවක් සකස් කරන්න.
  - එම ලැයිස්තුවෙන් ඔබ දැනට දෙමාපියන්ට ඉටු කරන යුතුකම් ඉදිරියෙන් (✓) ලකුණ යොදන්න.
  - මෙතෙක් ඔබට ඉටු කිරීමට නොහැකි වූ සහ ඉදිරියේ දී ඉටු කිරීමට බලාපොරොත්තු වන යුතුකම් ඉදිරියෙන් (X)ලකුණ යොදන්න.

- මෙම කරුණ පිළිබඳ ව ඔබගේ වැඩි අවධානයක් යොමු කරන්න.

ඔබ විසින් සකස් කර ලකුණු කරන ලද ලැයිස්තුවේ X ලකුණ යෙදුණු තැන් ඉදිරියෙන් ✓ ලකුණ දමා ගැනීම අවශ්‍ය ය. අද සිට එසේ කිරීමට අධිෂ්ඨාන කරගන්න. එවිට ඔබට සැබෑ කිතුනු දරුවකු විය හැකි ය.


| **මගේ යුතුකම්** | **ඉටු කරන** (✓) | **ඉටු කිරීමට බලාපොරොත්තු වන** (X) |
|---|---|---|
| | | |

"දරුවනි, ඔබේ දෙමාපියන්ට කීකරු වන්න. එය ක්‍රිස්තියානි යුතුකමකි. "ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න" යනු පොරොන්දුවක් ඇති පළමු වන ආඥාව ය. එනම් එසේ කිරීමෙන් ඔබට සෙත සැලසෙනු ඇත; ඔබ මිහිපිට බොහෝ කල් ජීවත් වනු ඇත යනුයි."

(එපීස 6:13)

## ඔබගේ ජීවිතයට...

- ඔබගේ දෙමාපියන් විවාහ වූ දිනය හා ඔවුන්ගේ උපන්දින ද අසා දැනගන්න.
- එම දින මතක තබා ගන්න.
- එදින දී ඔවුන්ට කුඩා ත්‍යාගයක් දෙන්න.
- ඔවුන් ඔබ වෙනුවෙන් මෙතෙක් කළ දේ සිහි කරමින් අගය කරන්න.
- ඉදිරි කාලය සඳහා ඔවුන්ට සුබ පතන්න.
- දිනපතා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන්න.



කිතුනු පවුල ආලෝකයක්